# අභයගිරිය සලපතර මළුවේ ගල් පුවරු පූජා කිරීමේ සම්ප්‍රදාය

**කේ.වයි.එම්.එස්. නිලක්ෂිකා**[1]

ඉතා ඈත අතීතයේ පටන් සිංහල සංස්කෘතිය හඳුන්වන්නේ ගමත්, පන්සලත්, වැවත්, දාගැබත් මුල් කරගත් සංස්කෘතියක් ලෙසිනි. ඉන් ගම්‍යමාන වන්නේ ශ්‍රී ලාංකේය හෙළ බෞද්ධයාගේ ආගමික සංකේත අතර ද මුල් තැනක් චෛත්‍යයට, දාගැබට එසේ නැතහොත් ස්තූපයට හිමි වන බවකි. ඒ අනුව නිර්මාණය කෙරෙන ස්තූපය නියමිත වාස්තුවිද්‍යා අංගවලින් සමන්විත වන අතර ඊට අනුබද්ධිත ඉතා සුවිශේෂි අංගයක් ලෙස සලපතර මළුව පෙන්වාදිය හැකිය. ස්තූපය වෙත පිවිසෙන ශ්‍රද්ධා භක්ති පූර්ණ පුද්ගලයා වැලිමළුවෙන් පසු පිවිසෙන්නේ සලපතර මළුව වෙතය. එය ස්තූපයේ සිට විහිදෙන අතර ගල් පවුරකින් සීමා වේ. එහි දී මුල් යුගයේ පටන් ඉදිකෙරුණු ස්තූපවලට අනුබද්ධිතව දක්නට ලැබුණු සලපතර මළුව නැමැති අංගය, ක්‍රි.පූ. 1 වැනි සියවසේ වළගම්බා රජ දවස ඉදිවුණු අභයගිරිය ස්තූපයට ද අනුබද්ධිත විය. අභයගිරි සලපතර මළුවේ ශිලාලේඛන දක්නට ලැබීම ද සුවිශේෂි වේ. ඒ අනුව අභයගිරිය සලපතර මළුවේ ගල් පුවරුවල ශිලාලේඛන පිළිබඳව අධ්‍යයනය තුළින් එකී ගල් පුවරු පූජාකළ සමාජ පංතීන් හඳුනාගැනීම පර්යේෂණයේ මුඛ්‍ය අරමුණයි. එම ගල් පුවරුවල සංස්කෘත, පැරණි සිංහල ආදී භාෂාවන්ගෙන් යුත් ක්‍රි.පූ. 1 වැනි හා ක්‍රි.ව. 11 වැනි සියවස්වලට අදාළ වන ශිලාලේඛන දක්නට ලැබේ. මෙසේ අභයගිරි සලපතර මළුවේ ගල් පුවරු ඇතිරීම එසේත් නැත්නම් ගල් පුවරු පූජාකිරීම ආගමික හා සංස්කෘතික වශයෙන් වැදගත් සම්ප්‍රදායක් විය. ඒ අනුව අභයගිරි සලපතර මළුවෙහි ගල් පුවරු ඇතිරීම හා සම්බන්ධව රාජකීයන්ගේ මැදිහත් වීම මහාවංසය ඇතුළු මූලාශ්‍රය ඇසුරින් සනාථ වුව ද අභයගිරි සලපතර මළුව සඳහා ගල් පුවරු පූජාකරන ලද්දේ කිනම් තරාතිරමක පුද්ගලයින් ද යන්න මෙම පර්යේෂණයේ ගැටලුව විය. මෙම පර්යේෂණය සඳහා ප්‍රාථමික මූලාශ්‍රය බවට පත් වූයේ ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ මානවශාස්ත්‍ර හා සමාජීයවිද්‍යා පීඨයේ ඉතිහාස හා පුරාවිද්‍යා අධ්‍යයනාංශයේ දෙ වැනි වසර උපාධි අපේක්ෂකයින් විසින් ශිලාලේඛන පිටපත්කරණයට හා සම්බන්ධ ප්‍රායෝගික පුහුණුවේ දී පිටපත්කරණයට ලක්කරන ලද ශිලාලේඛන වේ. ඒ අනුව අභයගිරි සලපතර මළුවෙහි ගල් පුවරුවල ඇති ශිලාලේඛන අනුව තවදුරටත් විද්‍යමාන වනුයේ ගල් පුවරු පූජාකළ පුද්ගලයින් පිළිබඳ සඳහන් කෙටි ලිපි ඒ අතර වන බවකි. සමහර ලිපිවල වැය වූ ධනය පිළිබඳව, විවිධ ප්‍රාර්ථනා ද ඇතුළත් වේ. ඒ අනුව අභයගිරි සලපතර මළුවෙහි ඇති ශිලාලේඛන අනුව පැහැදිලි වන්නේ රාජකීයන්, ප්‍රභූන් පමණක් නොව පොදු ජනතාව, විවිධ වෘත්තීන්හි නිරත පිරිස් මෙන්ම භික්ෂූන් වහන්සේ ද ගල් පුවරු පූජාකිරීමට නැතහොත් ගල් පුවරු ඇතිරීමට සම්බන්ධ වූ බවකි.

**ප්‍රමුඛ පද** : ස්තූපය, අභයගිරිය, ගල් පුවරු, සලපතර මළුව, ශිලාලේඛන

---

[1] ඉතිහාස හා පුරාවිද්‍යා අධ්‍යයනාංශය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය.shammiyapa@gmail.com